**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ)**
**எதிர்க்ட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்**
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition – Parliament of Sri Lanka

2025.12.21

ප්‍රමිතියෙන් තොර ඖෂධ මාෆියාවට එරෙහිව සෑම අවස්ථාවකම හඬ නගන සහ ඊට එරෙහිව නීතිමය පියවර ගත් එකම දේශපාලන පක්ෂය වන සමගි ජන බලවේගය, වත්මන් ජාතික ජන බලවේග ආණ්ඩුව යටතේ සිදුව ඇති ප්‍රමිතියෙන් තොර ඉන්ඩැන්සෙට්ට්‍රෙන් එන්නත් ආනයනයට එරෙහිවද සෘජුව විරෝධය ප්‍රකාශ කරන ලදී.

මෙරට තුළ සිදුකරන ප්‍රමිතියෙන් තොර ඖෂධ ආනයනයට එදා සිට අඛණ්ඩව හඬ නැගූ අප පක්ෂයේ නාගරික මන්ත්‍රී වෛද්‍ය චමල් සංජීව මහතා මෙවරත් මෙම ජනතා විරෝධී කටයුත්තට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගනිමින් සිටින පසුබිමක, ඔහුගේ එම ස්ථාවරය අප පක්ෂයේ ස්ථාවරය නොවන බවට ව්‍යාජ මාධ්‍ය නිවේදනයක් සකස් කර, යම් පාර්ශවයක් විසින් සමාජ මාධ්‍යයේ සංසරණය කරන බවට දැනගන්නට ලැබී තිබේ.

එම ව්‍යාජ මාධ්‍ය නිවේදනයට හසු නොවන ලෙසත්, මෙරට ජනතාවගේ ජීවිත සමග සෙල්ලම් කරන ඖෂධ මාෆියාවට එරෙහිව මා ඇතුළු සමගි ජන බලවේගය අඛණ්ඩව පෙනී සිටින බවත් අවධාරණය කරමි.

ප්‍රමිතියෙන් තොර ඖෂධ මාෆියාවට නොබියව පෙනී සිටින අප පක්ෂයේ නාගරික මන්ත්‍රී වෛද්‍ය චමල් සංජීව මහතාට ඒ වෙනුවෙන් ලබාදිය හැකි ශක්තිය සමගි ජනබලවේගයේ අප සියළු දෙනා නොපැකිළව ලබාදෙන බවත්, පුරවැසියන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා අප නිරන්තරයෙන් කැපවන බවත් අවධාරණය කරමි.

ස්තුතියි,

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
இலக்கம் 30, சேர் மாக்கஸ் பெர்ணாந்து மாவத்தை, கொழும்பு 07.
No. 30, Sir Marcus Fernando Mawatha, Colombo 07.

දුරකතන / தொலைபேசி / Telephones: 011 2699171, 011 2699204
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2699174
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E – mail: sajith_p@dialogsl.net, oppositionleader.sp@gmail.com